Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## අගලවත්ත ප්‍රාදේශීය සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ අගලවත්ත ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| 01. | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| | කාර්යාල කාර්ය සහායක III | 01 | PLI-2016 - රු. 24,250-10x250-10x270-10x300-12x330- රු. 36,410 | අධ්‍යාපන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාග යේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයයන් හය (06) ක් සමත් වී තිබීම (මින් විෂයයන් 05 ක් එකවර සමත් විය යුතුය) |

02. කායික සුදුසුකම් : තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

03. *අවශ්‍ය අනෙකුත් සුදුසුකම්* :

a. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
b. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
c. යහපත් චරිතයකින් යුක්ත හා මනා ශරීර සෞඛ්‍ය තත්වයෙන් යුක්ත විය යුතුය.
d. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.
e. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබීම.

04. *වයස* : අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා වැඩිම ලකුණු ලබාගත් අනුපිළිවෙළ මත බඳවා ගැනීම සිදු කෙරේ.

06. *අයදුම්පත් ඉදිරිපත් කිරීම* :

a. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කර ගන්නා ලද අයදුම්පත 2017.11.24 දිනට හෝ එදිනට පෙර "ලේකම්, ප්‍රාදේශීය සභාව, අගලවත්ත" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

b. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "කාර්යාල කාර්ය සහායක තනතුර සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කළ යුතුය.

c. අයදුම්පත සමග පහත සඳහන් සහතිකල පිටපත් අමුණා එවිය යුතුය :-

*(අ)* උප්පැන්න සහතිකය;
*(ආ)* අධ්‍යාපන සහතික;
*(ඇ)* පාසලෙන් අස්වීමේ සහතිකය;
*(ඈ)* පදිංචිය සහතික කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් සහතික කර තිබිය යුතුය);
*(ඉ)* මෑතක දී ලබා ගත් චරිත සහතික 02 ක්.

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේදී හෝ බඳවා ගැනීම හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල අගලවත්ත ප්‍රදේශීය සභාවේ ලේකම් සතුය.

ලලනි දීපිකා උඩුමුල්ල,
ලේකම් හා සභාවේ බලතල කාර්ය කර්තව්‍යක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
අගලවත්ත ප්‍රාදේශීය සභාව.

2017 ඔක්තෝබර් මස 24 වැනි දින.

ආදර්ශ අයදුම්පත්‍රය

*අගලවත්ත ප්‍රාදේශීය සභාව*

*අගලවත්ත ප්‍රාදේශීය සභාවේ කාර්යාල කාර්ය සහායක III තනතුර සඳහා අයදුම්පත්‍රය*

1. අයදුම්කරුගේ නම මුලකුරු සමග :————————————————.
2. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————————————————.
3. ස්ථිර ලිපිනය :————————————————.
4. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————————————————.
5. දිස්ත්‍රික්කය :————————————————.
6. උපන් දිනය ඃ අවුරුද්ද:———— මාසය:———— දිනය :————
7. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට (2017.11.24) වයස ඃ- අවු. :———— මාස :———— දින :————
8. ස්ත්‍රී පුරුෂ භාවය :————————————————.
9. විවාහක/අවිවාහක බව :————————————————.
10. ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද ලියාපදිංචි වීමෙන් ද යන වග:————————————————.
11. ජාතික හැඳුනුම්පත් අංකය :————————————————.
12. දුරකථන අංකය :————————————————.
13. අධ්‍යාපන සුදුසුකම් :————————————————.

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි නිවැරදි බවට ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද දනිමි.

————————————

අයදුම්කරුගේ අත්සන.

දිනය :————————